

## සඳ පැතුම

තාරකා මල් පිපී
සිනා සෙයි සිරි යහන
අමාවක ගෙවාගෙන
සඳ ඒවි දැන් ගෙදර

පෙති එකින් එක තියා
අප තැනූ මල් පැතුම
ගැන පුංචි රහසක්
තිබේ එන්නකො හනික

සඳ හොරෙන් බලා පෙම්
අසාගෙන ඉන්න බැවි
කියන පෘථිවියේ පෙම්-වතුනි
මෙය අසන් දැන්
අපෙ මියුරු පෙම් කතා
අසාගෙන හිඳින් දැන්

රන් හුයෙන් අත් ඇඟිලි
පැටළුණත් ඇවිද ගොස්
මිතුරි හා මිතුරු වී
මහ සැපත සොයා ගොස්
යහන දෙපසට වෙලා
නැගි වෙහෙස නිවා ලන
පෙම්වතුනි දැනෙනව ද
අප ලබන මේ සතුට
ජීවිතේ මීට පෙර
නො ලැබුවා වූ සතුට
ඔබ අසන මේ රහස

දනිමි මම් පුර හඳක
සතුට ඇති නුඹ ගාව
තබා හිස මකුස මත
අසා ඉනු සඳ පැතුම

**අප්සරා පොඩිමැණිකේ**

## කිරි සිනා පෙරී පෙරී

**පුංචි පුංචි ලෝකයක්**
**මැවී ඇතේ අතේ**
**සත් වසක් බලා සිටි**
**නැවුම් ලොවක් අනේ**
**කිරි සිනා පෙරී පෙරී**
**දෝරෙ යයි කිරි**

**පුංචි අපේ ලෝකෙටත්**
**ඉරක් ඇවිත්**
**හඳක්**
**ඇවිත්**

**ප්‍රසාදිනී වෙත්තසිංහ**

## තේරුම් ගතිමි

කියවන කියවන තරමට
ඇවිදින ඇවිදින තරමට
තේරෙනවා
නොතේරෙන තරම
අපට නැති තරම

නොතේරෙන දේ තේරුම් කරගන්න
නැති දේ ඇති කරගන්න
කියවනවා කියවනවා
ඇවිදිනවා ඇවිදිනවා
....

අන්තිමට
කාලය ගෙවුණා විතර ද??

**නිහාල් රූපසිංහ**

## මරණය අභියස සිට

කපා දැමූ රඹ කඳ මෙන් වැටුනි ඇඳ
දපා එලෙස සිටියෙමි තණ පිටිය මැද
සැපා කියා දිය කෙළි විඳි කටක රඳ
තොපාදුන් ඔබා මට මිත අකැප විඳ

බඳවා ඳරුහැන් ඉඳිකටු ලා දුබල ගතේ
හඬවා ඳසයිරනය ඉගිළුනි ගිලන් රතේ
කැඳවා යන්න ආ මරුවා සිනාසෙතේ
වඩවා විරිය ගත දිරි ඉපිදවිමි සිතේ

නහර තුල බැඳුණු කාරම් බලය දි දී
නතර කළා හදවත ගත සිසිල සැ දී
වැතිර සිටි මගෙ ම රුව නිසසලව බැ ලී
අතර තුර බැලූවෙමි සිට අහසෙ රැ ලී

සිව් සාලිස් වසක ගතවෙන දිවි මගෙහී
ලිව් කවි මිසක කළ පොතකුදු නැති සඳෙහී
පව්! පුතු සිතෙන් යයි පිය මතකය ගිලිහී
එව් සිතුවිලි රැසින් ඇතිවිය දිරි සිතෙහී

එන් නට බැහැ තවම දතම පැමිණ නැත
යන් නට පෙර කළ යුතු වැඩ අපරිමිත
සන් කර මරු යවා ආපසු එලොව වෙත
සන් සුන් ගත තුලට යලි වැද ගතිමි මිත

වැතිර ඇඳක දැඩි සැලකුම් ඒකකයේ
වයර ලා අතේ නාසයෙ ගෙලේ ලයේ
නිතර සිහින මැද ඔසු බල දරා කයේ
සසර කළ පවද ඒ ලෙස ගෙවී ගියේ

**රසික සූරියආරච්චි**

## සෙනෙහස

*සෙනෙහස නුඹේ ගිනි යම වැසි පොද ගානයි*
*සෙනෙහස නුඹේ ළා ගොයමේ නිල ගානයි*
*සෙනෙහස නුඹේ පිපි කුසුමේ රොන් ගානයි*
*සෙනෙහස නුඹේ ගල කෙටූ අකුරේ ගානයි*

*සෙනෙහස නුඹට අහසේ තරු කැට ගානයි*
*සෙනෙහස නුඹට වෙරළේ වැලි කැට ගානයි*
*සෙනෙහස නුඹට වෙන උපමා නැති ගානයි*
*සෙනෙහස නුඹට හදවිල උතුරන ගානයි*

*සෙනෙහස අපේ යායක් පීදෙන ගානයි*
*සෙනෙහස අපේ රැනක් ඉගිලෙන ගානයි*
*සෙනෙහස අපේ මීයක් වෑහෙන ගානයි*
*සෙනෙහස අපේ මීවිත උතුරන ගානයි*

***මොරගොඩ මලියසේන***

## ආදරයට වාරකන්

ඇලුම් බැලුම් නෑ
ඇනුම් පදත් නෑ
බරට අඩි තියං එන හඬත් නෑ
දුරකතනයත් ගොළුයි
ජංගමයටත් වාරයක් නෑ
ඉඳහිට ඇහුවම
-ආදරේ ද මට? "
-ඔන්න පටන් ගත්තා "
කියලා බලන බැල්මත් නෑ
හිතට නිවනක් නෑ
ආදරයට නිවාඩුවක් ද
නෑ..
ආදරයට වාරකන්

**අමා දම්රානි**
**මෙල්බර්න්**

## හිමි අහිමි වූ ළඳක්

වනයේ විසල් තුඟු තුරු වියනක් විලසින්
අප දිවි කැදැල්ලට සිසිල වූ සෙවණ දෙමින්
හිමි, ඔබ අකල් රුදු ගමනට පත වීමෙන්
අප හැම දෙනා තනි විය අසරණ තාවෙන්

පිපි රුවැති කුසුමක් ලෙස සුවඳ දිදී
පර වී ගියත් ඔබ ජීවන සුවඳ රැඳී
මා සිත වෙළා ගත් ඔබ ගුණ තදින් රැඳී
හොල්මන් කරනවා නිතැතින් සිතේ වැදී

තාත්තා ගෙදර එන්නේ කවදද අසමින්
පොඩි දුව පනියි මවගේ ගෙල වැළඳගමින්
පැනයට පිළිතුරක් දෙන්නට බැරිව සොවින්
රතු නෙත් සඟල සැඟවිය දරුවාට හොරෙන්

කිරිකැටි දරුවන්ට පිය සෙනෙහස පාමින්
ඇකයේ හොවා ගෙන සුරතල් බස් අසමින්
ගත කළ අතීතය සිහියට නගාලමින්
කුතුහලයෙන් පෙලෙති දරුවෝ නිති සෝකෙන්

කුණාටුවට අසු වූ ඔරු කඳ විලසින්
ජීවන ඔරුවෙ හබලත් සුණුවිසුණු වෙමින්
ජීවිත සයුරෙ හැපි හැපි තරණය කරමින්
පරතෙර සොයා යමි අද දිරි ගෙන එඩියෙන්

පුන්සඳ වගේ සොමිගුණ පාමින් මෙමට
මගෙ තනි නොතනියට සෙවනැල්ලක් ලෙසට
සිටි ඔබ අප අතැර නොඑනා ගමනකට
පියවර තැබුවෙ ඇයි දැයි ගැටළුවකි මට

සීතල රිදී දිය දහරක් වගේ වෙලී
දාහය නිවා දැමූ ඔත් මා හදේ ගිලී
තුඟු අහස් කුසේ පුන්සඳ වගේ දිලී
ඒකාලෝක කළ යුගදිවි සහන් එළී

පූර්වාදර්ශයට ගනිමින් බුදු දහම
ජීවිතයේ සැනසුම් සුව ලැබ නියම
ජීවිත අනියත යි මරණය නියම
පසක් කර ගැන්ම අප හට වෙයි උරුම

සෙනෙහෙලතා රත්නායක
- ක්ලේටන්
(2009 ජුනි 19 මෙලොව හැර ගිය ඉන්දික හේවාගම වෙනුවෙනි.)

***අන්තර්ජාලයේ සාහිත්‍ය කවුළුව***
***www.ketapathpawra.com***

# පහන් වැට

සංස්කරණය තුෂාරි ප්‍රියංගිකා

## මව් සමර

ඔබ නැති වෙලා ගත විය පසළොස් වසරක්
හදවත දැවෙයි තවමත් ලෙස ගිනි උඳුනක්
ඔබ මතකයට එය හසු වන හැම මොහොතක්
දිනයක් නොමැත ඔබ ගැන නොහෙලූ කඳුළක්

දියුණුව සොයා ගෙන පිටරට ඇවිල්ලා
බැලුවත් අම්මා ගැන නිතරම සොයාලා
හිටිවන නොසිතූ ලෙස අම්මා ගිහිල්ලා
කොහොමට ගනිම් මම මේ දුක උහුල්ලා

වැඩ කරනා අතරතුර ඔබෙ රුව දකිමී
ඔබ වැනි කෙනෙක් දුටු විට මග නතර වෙමී
පුතා කියා මා අමතන හඬ සොයමී
අම්මා මගේ ළඟ ගැවසෙන බව දනිමී

දහවල ඉරයි රැය සඳ වෙයි මගෙ අම්මා
ගලනා දොලේ සිහිලස වෙයි මගෙ අම්මා
හමනා මඳනලේ ගීතය මගෙ අම්මා
කරුණා ගුණයෙ උල්පත වෙයි මගෙ අම්මා

ඔබ ළඟ ඉන්න බැරි වුණෙ ඇයි පවසන්න
ඔබ හැර යළි නොයන්නට දිවුරුම් දෙන්න
කඳුළින් මගේ ඔබ දෙපතුල ෙ සෝදන්න
අම්මේ මතු භවෙක මට අවසර දෙන්න

සරත් වීරසේකර - කැනඩාව



## නිහඬ කිරීම

කූඩුවක සිටින කුරුල්ලෝ
ගයති නෙක ගී නද
ලඟ ගසක සිටින කුරුල්ලෝ
සතුටු වෙති අසා ඒ පද.

කම්බි දැල මත හැපෙමින්
කූඩුවේ කුරුල්ලෝ
අසති හඬ ගා
කොතෙක් නම්
පියකරුද එළිමහන.

මිතුරු වෙමු අපි
හඬ ගා අසයි
කූඩුවේ උන්
මොරදී කූඩුවද පෙරලමින්
නොතේරෙයි ඒ බස
නිදහසේ උන් අයහට.

අතුපතර කෙළිදොලෙන්
සරමින් උන් කියත්
මිහිරිය නුඹෙ ගී හඬ
ගයනුව තවත් ගී පද.

පියාපත් හකුලාන
හිස එමත සඟවාන
කූඩුවේ උන් කුරුල්ලෝ
නිහඬ වෙති ශෝකයෙන්.

**චන්ද්‍රිකා ද සිල්වා**

## නොඅසමි මම

මව් පිය දරු සෙනෙහස වෙන් කොට
වැට කඩොලු බඳින්නේ
සොයුරු පෙමට මහ පවුරු බඳින්නේ
නුඹට අහිමි වූ නිසාදෝ
දැයි නොඅසමි මම

මව්පිය සෙනෙහසට සොයුරු පෙමට
සිනා පොදට වෛර කරන්නට
නුඹට හුරු වූයේ කාගෙන්දෝ
දැයි නොඅසමි මම නුඹගෙන්
නුඹට අහිමි වූ දෑ
අපට ද අහිමි වූ දා
සිනා සලන්නට නුඹට හැකිදෝ
දැයි නොඅසමි මම

සිනා පොදක් නො;ටුවාදෝ
සෙනෙහේ බිඳක් නොලැබුණාදෝ
දැයි නොඅසමි මම
පෙර දින නුඹ දිවියේ
නුඹට නුපුරු; සෙනේහය
නුඹට නුපුරු; සිනාව
අප ලග පිරී ඉතිරී ඇත
ඇයිදැයි ඒ දෙස නොබලන්නේ
නොඅසමි මම නුඹගෙන්

**සුජීවා ඉල්ලංග**